

# සිංහලයාට “සිංහලේ” පිලිබඳව ඇති “අයිතිවාසිකම, වගකීම සහ අභිමානය”

සුදර්ශන රම්බන්ඩාර

**2017 පෙබරවාරි 04**


බුදුන් තෙවරක් වැඩිය
මේ පින් බිම සිංහලේ මහා
රජවරුන් ගොඩනගපු
මාගේ මුතුන් මිත්තන්
රැක බලාගත්තු
මේ උතුම් පින් බිමේ
මම සිංහල බෞද්ධයෙක්
කියන්න
බය වෙන්නේ නෑ
ආඩම්බර වෙනවා


මම මේ වීර්යය කරන්නේ සිංහල ජාතියට ද, බුද්ධාගමට ද ඇති බලවත් කරුණාව නිසයි. සිංහලයිනි! සමගියෙන් ක්‍රියා කොට දියුණුව කරා පැමිණීමට උත්සාහ කරව්.
අනගාරික ධම්පාල තුමා


සිංහලයන්ගේ පිරිහීමට ප්‍රධාන හේතුව අසමගිය බැවින් සිංහලයන් නිතරම සමගියෙන් සිටිය යුතුය
-අනගාරික ධර්මපාලතුමා-

# සිංහලයාට "සිංහලේ" පිලිබඳව ඇති "අයිතිවාසිකම, වගකීම සහ අභිමානය"

රටට නිදහසක් ලබාගත්තද ගෙවීගිය 69 වසරක් තිස්සේ ගුණාත්මකවත්, ප්‍රමාණාත්මකවත් මෙන්ම මානසිකවත් පිරිහී ඇත්තේ සිංහල ජාතියයි! වරද සොයාබලා පිළියම් යොදාගත නොහැකිද?

අපේ සිංහල බෞද්ධ දේශපාලකයෝ බලය ලබාගැනීමටත්, එය රැකගැනීමටත් යයි මෙරට සහ ඉන්දියාවේ කෝවිල්, දේවාලවලට බාර හාරවී, බරට බරක් රන්, රිදී පවා පුදමින් ඒවා අකුරටම ඉටුකරති. ඔවුහු තමන්ට ජන්දයෙන් බලය ලබාදුන් බහුතරයේ සිංහලකමට හෝ බෞද්ධකමට හෝ හිමි අයිතිවාසිකම් රැකීමට කිසිඳු උත්සාහයක් නොගනිති. එසේම රජයක් පිහිටුවීමට සහයදෙන සුළුජාතික, අන්‍යආගමික පක්ෂ වලට වූ පොරොන්දු, වරදාන ද අකුරටම ඉටුකරන්නේ තමන්ට බලය ලබාදුන් බහුතර සිංහලයාගේ දිවයින පුරා තිබෙන ජාතික උරුමයන්, ආගමික අයිතිවාසිකම් සහ ආගමික නිදහස නිර්දයලෙස ප්‍රතික්ෂේපකරමින් පමණක් නොව ඒවා සුළුජාතිකයන්ට සහ අන්‍යආගමිකයන්ට ආඩම්බරයෙන් පාවාදෙමින්ය. ඔවුහු වියතුන්, බුද්ධිමතුන් එකහෙලා ප්‍රතික්ෂේපකරන අඳබාල සර්ව ආගමික සංකල්පය යටතේ, අන්‍ය ආගමික පූජකයින් සමඟ අපේ ගරුතර පූජ්‍ය පක්ෂයවන සංඝරත්නය ද වඩා හිඳුවමින් සාමය, සංහිඳියාව සහ සහජීවනය "නොදන්නා" සිංහලයාට පෙනෙන්නට යයි සර්ව ආගමික පූජාවන්ද පවත්ති.

දෙමළ දේශපාලකයෙකු වන සුමන්තිරන් මහතා ලඟදී රූපවාහිනී නාලිකාවකදී කියා සිටියේ ව්‍යවස්ථාවෙන් බුදු දහමට ප්‍රමුඛස්ථානයක් දීමට කොහෙත්ම බැරි බවයි. පසුගිය දා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා පත්කර ඇති මෙහෙයුම් කමිටුවේදී ද්‍රවිඩ ජාතික සන්ධානය නියෝජනය කරමින් ඒ මහතා කීවේ ශ්‍රී **ලංකාවේ ජීවත් වන සියලු ජාතීන්ට එක සමානව සළකන බවට වත්මන් ආණ්ඩුව පොරොන්දු වනවා නම් කිසිදු ආගමකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රමුඛතාව ලබාදිය නොහැකි බව**" ය.




අනේ දෙයියනේ! බුදු දහමට සහ සිංහල බෞද්ධයාට තිබෙන එකම රටයි කියා සිතා සිටින මේ පුංචි රටේ සිංහලයාට අයිතිවාසිකමක් ඇත්තේම නැද්ද? ඉඩම් නඩුවකදී තමන්ගේ අයිතිය පෙන්වීමට, තහවුරු කිරීමට නම් ගෙයි තිබෙන ඔප්පුව එළියට ගෙන ඉදිරිපත්කලයුතුය. එසේ එළියට ගන්නට නම් ඔප්පුවක් තිබෙනබව මතක තිබිය යුතුය. අවුරුදු 2500 කාලයක පෙරසිට මොකක්දෝ අයිතියක් අපට තිබෙන බව සිංහල බෞද්ධ කවුරුත් දනිති. මතුරති. අපේ දෙමළ සහෝදරවරු ඔවුන්ගේ නිජබිම යයි පෙන්වන්නට ව්‍යාජ ඊළාම් ඉතිහාසයක් ගොතා ලොවක් රවටන්නට කැපවෙති. **"හොර ඔප්පු ලිවීමක්"** වැනි වූ මෙම ඊළාම් මිත්‍යා වංශය බොරුවක් යයි අප ඔප්පුකලෙමුද? අපේ සිංහල බෞද්ධයාට මේ රටේ තිබෙන අයිතිය කුමක්ද? අපේ ඔප්පුව සොයාගතයුතුයි නේද?

**"සිංහලේ" නම්වූ අප රට පිළිබඳව සිංහලයා සතු අයිතිවාසිකම**

"සිංහලේ" නම්වූ අප රට පිළිබඳව සිංහලයා සතුවූ, කිසිවෙකුටවත් අභියෝග කළනොහැකිවූ, ශුද්ධවූ, නිරවුල් අයිතිවාසිකම පිලිබඳ ඓතිහාසික පසුබිම අද වනවිට සිංහල අපටම අමතකවී තිබීම බලවත් අවාසනාවකි. එම පසුබිම එනම් **"අපේ අතීත රජදරුවන් විසින් මේ පින් බිම බුදු සසුනට නම වතාවක් පූජාකිරීම"** පිළිබඳව යළි සිහිපත්කරදෙමින් සිංහලයා දැනුවත් කිරිමටත් ඒ මගින් දැනට විවිධ ලෙස බෙදී ඇති අප සිංහල ජාතිය එක්සත් කිරිමටත් කාලය එළැබී ඇත.

සිංහල අප විසින් දිනවිය යුත්තේ නොයෙකුත් න්‍යායපත්‍ර, දර්ශන සහ මතවාද වලින් යුත් දේශපාලන පක්ෂ හෝ එවන් පක්ෂ කරපින්නාගෙන සිටින දේශපාලකයින් හෝ නොව **"සමස්ත සිංහල ජාතියමය"**. සිංහල අප රටත්, ජාතියත්, ආගමත් වර්තමානයේ මුහුණ පා ඇති බිහිසුණු ව්‍යසනයෙන් ගොඩ ගැනීමට හැක්කේ "සිංහලේ" නම්වූ රටේ සිංහලයාට ඇති ඉහතකී අයිතිය පිලිබඳ අර්ථවත් ලෙස දැනුමින් සහ බුද්ධියෙන් සන්නද්ධව, ජාතියක් වශයෙන් අභිමානයෙන් යුතුව එක්සත්විමෙන් පමණකි.

**'සිංහල දීපය' උතුම් සංසරත්නය හමුවේ සම්බුද්ධ ශාසනයට නම වතාවක් පූජාකිරීම**

අප ඉතිහාසයේ සුවිශේෂී සිද්ධීන් ලෙස සැලකිය යුතු අවස්ථා ගණනින් නවයකි. එහිදී සිදුවුයේ බුදු දහම සුරක්ෂිතව පවතින්නේ මෙම දිවයිනේ බව දන්නා අපේ

රජවරු කීපදෙනෙක් ඔවුන්ගේ අල්පේච්ඡතාව, නිහතමානී බව, සද්ධාවන්ත බව, ත්‍යාගශීලී බව, සහ ශ්‍රේෂ්ඨ පූජා බුද්ධිය විදහා දක්වමින් වරින් වර නම වතාවක්ම මෙම **'සිංහල දීපය'** උතුම් සංසරත්නය හමුවේ සම්බුද්ධ ශාසනයට පූජා කිරීමය. ඒ සෑම වාරයකදීම මෙම අග්‍රතර පූජාව ඉවසා භාරගත් ගරුතර සංඝරත්නය මෙම දිවයින සහිත රාජ්‍යය නැවත නැවතත් රජතුමාටම භාර කළේ ශාසනය වෙනුවෙන් ආරක්ෂා කරගෙන පාලනය කරගෙන යාමටය. මෙහි විස්තර වංශ කථා වලත්, ධර්ම ග්‍රන්ථ වලත්, ජනප්‍රවාදයේත් සඳහන්වේ.

**අපේ රජදරුවන් මෙම සිංහල ද්වීපය සහිත රාජ්‍යය සංඝරත්නය හමුවේ පූජාකළ අවස්ථා නවය (09)**

1. දෙවන පෑතිස් රජතුමා ( එක් වරක්) ~ ශ්‍රී මහා බෝධින්වහන්සේට
2. දුටු ගැමුණු රජතුමා ( පස් වරක්)
3. සද්ධාතිස්ස රජතුමා ( එක් වරක්) ~ බණ පිරිකරක් ලෙස කාළබුද්ධරක්ඛිත හිමියන්ට
4. කිත්සිරි මෙවන් රජතුමා ( එක් වරක්) ~ දළදා වහන්සේට
5. දෙවන අග්බෝ රජතුමා ( එක් වරක්) ~ ථූපාරාමයට




සෑම සිංහලයෙක්ම තම රට, ජාතිය සහ ආගම පමණක් නොව තමාගේත් අනාගත සුරක්ෂිත පැවැත්ම උදෙසා මෙම ඓතිහාසික අවස්ථා කීපය හැදෑරීම යෙහෙකි. සිංහලේ නම්වූ අප දේශයේත්, සිංහල ජාතියේත්, සම්බුද්ධ ශාසනයේත් ආරක්ෂාව සහ පැවැත්ම වෙනුවෙන් අප සැම දෙනාම මෙම අවස්ථාවන් සියල්ල සමස්ථයක් ලෙස ගෙන තරයේම අවධාරණය කළයුතුය. මීට වඩා ආරක්ෂාවක්, පිහිටක්, සරණක් අපට තවත් නැත්තේය.

**බුදු සුසුනේ පැවැත්ම වෙනුවෙන් රජතුමා රටේ භාරකාරත්වය දැරීම**

ඉහත කී පූජා කිරීම් වලට අනතුරුව සිදුවූයේ බුදු සසුනේ පැවැත්ම සඳහා රජතුමා රටේ අයිතියක් වෙනුවට භාරකාරත්වය දැරීම පමණි. රජතුමා සංඝරත්නයේ අවවාද අනුශාසනා ද අනුව රාජ්‍ය විචාරීම කළේ ය. රජු රට රැක්කේම පාලනය කළේම බුද්ධ ශාසනය වෙනුවෙනි. බුද්ධ ශාසනය රැකීමේ වගකීමත් ඒ සඳහාම රට

රැකීමේත්, පාලනය කිරීමේත් අයිතිවාසිකම රජුට ලැබෙන්නෙ මේ ආකාරයෙනි. විටින් විට මෙය නව වතාවක්ම මෙසේ සිදුවීමෙන් ඉතා පිරිසිදු ලෙස, ස්ථිරසාර ලෙසම සමස්ත සිංහලේ දිවයිනම බුදු සසුනට පූජා කළ පුණ්‍ය භූමියක් බවට පත්වන්නේය. අප රටට ''**ධර්ම ද්වීපය**'' යන විරුදාවලිය ලැබීමටත් **"ගෞතම බුද්ධ රාජ්‍යය"** සහ ''**බුදුන්ගේ දේශය**'' යනුවෙන් හැඳින්වීමටත් සුදුසු වන්නේ එහෙයිනි.

සිංහලේ රජුට ඇති රට රැකීමේ මෙම අයිතිවාසිකම ලොව අපටම විශේෂිත වූවක් බව මෙයින් හඳුනාගත යුතුය. සිංහලේ රජු නැති කළ මෙම භාරකාරත්වයේ අයිතිවාසිකම ලැබෙන්නේ ''**මුලු මහත් සිංහල ජාතියටමය**''. මෙම අයිතිවාසිකමට අභියෝග කිරීමට මිහිපිට කිසිවෙකුටත් නොහැකිය. මේ අනුව මෙරට වාසී සියලුම ජනතාව මෙම ඓතිහාසික සත්‍යය නොබියව එකහෙලා පිළිගත යුතුය. ඒ ගැන කතාකළ යුතුය. නොදන්නා කෙනෙකුට නොබියව පැහැදිලිකරදිය යුතුය.

සිංහල ජාතිය සතු මෙම දිවයිනේ භාරකාරත්වයට විරුද්ධ වන්නකු වේ නම් ඒ උන්මත්තකයෙකු හෝ පරගැතියෙකු විය යුතුය. නැත්නම් ආත්ම ගරුත්වය නිශ්චිත මුදලකට විකුණුනු ජාති භ්‍රෂ්ටයකු වියහැක. සිංහලයාට නොදෙන වරදානයන් සුළු ජාතික සහ සුළු ආගමික පිරිස්වලට දෙමින් ඔවුන්ගෙන් බලය පතන බලලෝභී දේශපාලකයින්ද, සිංහල අපළඟ කවදත් තිබූ හෙයින් කිසිදා නොඉල්ලු සහජීවනයක්, සංහිඳියාවක් අපතුල ඇතිකිරීමටයි මුරගාමින් සිංහලයාටම, බෞද්ධයාටම තහංචි, බාධක පනවා අසිංහලයින් සහ විදේශික බලවේග පිනවන අමන දේශපාලකයින්ද සිංහල ජාතිය සතුව දුර අතීතයේ සිට පවතින මෙම අයිතිවාසිකමට එරෙහිවිය හැක.

**සිංහලයාට ලැබුණු විශේෂ අභිමානය**

සම්බුද්ධ ශාසනය රැකීමට ද ඒ වෙනුවෙන් මේ දිවයිනෙහි භාරකාරත්වය දරමින් එය රැක පාලනය කිරීමේ ශුද්ධ වූ අයිතිවාසිකම, වගකීම සහ යුතුකම දැරීමට ද ලැබීම ජාතියක් වශයෙන් සිංහලයාට ''**විශේෂ අභිමානයක්**'' ගෙනදෙන්නකි. එපමණක් නොව නූතන ව්‍යවස්ථා සම්පාදනයේදී යොදාගන්නා ''**ජනතා පරමාධිපත්‍ය**'' අවුරුදු දෙදහසකටත් පෙර ඉතා ගෞරවනීය අන්දමින් සිංහලයාට හිමිවන්නේද ඉහතකී **"අයිතිවාසිකම සහ වගකීම"** මහින්දාගමනට අනතුරුව සිට අපට දරන්නට ලැබීමෙනි. අද රටත්, සිංහල බෞද්ධයාත් මුහුණපා සිටින කෙනහිලි, ගැටළු, ප්‍රශ්න සහ අභියෝග යන සියල්ලම ජයගැනීමට අප යොදා ගත යුත්තේ මෙම සත්‍යයයි. නිදහසින් පසු පහළවූ දුබල, දීන, පරගැති පාලකයින් විසින් හෙලා දකින, නොසලකා හරින සිංහලකම, බෞද්ධකම ඔසවා නිසි තැන තැබීමට නම් අප විසින් අවබෝධයෙන් යුක්තවම වහා දරාගත යුත්තේ මෙම විශේෂ අභිමානයයි.

පරමසත්‍යයට, ප්‍රඥාවට මුල්තැන දෙන, ලෝක සත්ත්වයාට උතුම් නිවන සාදා දෙන ශ්‍රේෂ්ඨ බුද්ධශාසනය වසර පන්දහසක් කල් සුරැකීමට ඇති උතුම් අයිතිවාසිකම, වගකීම සහ යුතුකම දැරීමෙන් ලැබුණු මෙම විශේෂ අභිමානය නිසා සිංහලයා **"සත්‍යවාදී"** වුවා මිස අන්තවාදී වීමක් හෝ ජාතිවාදීවීමක් හෝ ආගම්වාදීවීමක් හෝ නොවන බවට අපේ **"දුර්වල සිංහල සහෝදරයින්"** බියවියයුතු නැත. ඒ බව තම තමාගේම බුද්ධියෙන් විමසා දතහැක. මේ ගැන විවාදයක් අනවශ්‍ය නමුත් විස්තර නොකරම බැරිය. මෑත අතීතයේ මෙරටට පැමිණ වසන ජාතිවාදී, ඊළාම්වාදී සංක්‍රමණික දෙමළ ජනතාව වෙනුවෙන් පැන පැන උදවු කරන ඊළාම්වාදී තමිල්නාඩුවකුත්, දෙමළ ඩයස්පෝරාවකුත් සිටී. එසේම මෙරට පැමිණ වසන ආගම්වාදී, වහාබ්වාදී සංක්‍රමණික මුස්ලිම් ජනතාවගේ සුභසිද්ධියට සහ ඔවුන්ගේ ව්‍යාප්තියට උදවු කරන වහාබ්වාදී අරාබියකුත් තවත් මුස්ලිම් රටවල් යයි කියාගත් බොහෝ රටවල් තිබේ. නමුත් සිංහලයාට ඇත්තේ **"සම්බුද්ධ සාසනය වෙනුවෙන් රැකගතයුතු"** මේ පුංචි තනි "සිංහලේ" පමණි. මේ ශුද්ධ භූමියේ සංක්‍රමණික ඊළාම්වාදීන් හෝ වහාබ්වාදීන් හෝ සමග බෙදාගන්නට දෙයක්, ඕනැකමක් හෝ හැකියාවක් අපට නැත. ජාතිවාදී සහ ආගම්වාදී නොවන සංක්‍රමණිකයින් සමග සහජීවනයෙන්, සංහිඳියාවෙන් සිංහලයාට ජීවත්වියහැකි බව අපි අපේ ඉතිහාසයෙන් වෙන්වාදී ඇත්තෙමු. ඊනියා සහජීවන, සංහිඳියා පාඩම් ඉගැන්වියයුත්තේ සිංහල බෞද්ධයාගේ අයිතිවාසිකමට බලපෑම් කරන මෙරට වසන ජාතිවාදී සහ ආගම්වාදී සංක්‍රමණිකයින්ට මිස සිංහල අපට නොවේ.

**සිංහලයා තමාගේ අයිතිවාසිකම, වගකීම සහ අභිමානය දැරීම පිළිබඳ අතීතයෙන් පාඩම්**

දුටුගැමුණු රජතුමාගේ උතුම් ප්‍රකාශය වන **"මාගේ මේ ව්‍යායාමය හුදෙක් රජසැප පිණිස නොව සම්බුද්ධ සාසනයේ චිරස්ථිතිය සඳහාය (රටත්, ජාතියත්, බුද්ධ සාසනයත් බේරාගැනීම සඳහාය)"** යන්න මුළුමහත් ජාතියටම ගතයුතු මග පෙන්වා දී ඇත. ඒ අනුව ක්‍රියාකළ අතීත රජවරු ඇතුළු සිංහලයෝ තම "අයිතිවාසිකම, වගකීම සහ අභිමානය" සිත්හි දරාගෙන ක්‍රියාවෙන්ම තම වගකීම ඉටු කලෝය. විටින් විට පැමිණි පරදේශක්කාරයන් සමග සිංහලයා එඩිතරව සටන් කළේ සාසනය වෙනුවෙන් රට රැක ගෙන පාලනය කරන රජුට සහාය දැක්වීම සඳහාය.

සිංහලේ රාජ්‍ය නායකත්වයට පත්වන්නා උපතින් සිංහලයෙක් නොවුවද අනිවාර්යෙන්ම බෞධයෙකු වියයුතුයි උපතින් සිංහලයෙක් නොවූ නිශ්ශංකමල්ල රජු ප්‍රඥප්තියක් වශයෙන්ම ප්‍රකාශයට පත්කර තිබුණි. නිශ්ශංකමල්ල රජු මෙන්ම අප සිංහලේ රාජාවලියේ අවසන් රජවරුන් වන නායක්කාර වංශිකයින් කීපදෙනාද බුදු දහම වැළඳගෙන සිංහල නම් දරා බෞද්ධ රජවරු ලෙස රට පාලනය කළේ,

බුද්ධ ශාසනයට මුල් තැන දුන්නේ සහ එහි දියුණුවට අනලස්ව කටයුතු කළේ සිංහලේ රට වැසියාගේ ප්‍රසාදය දිනා ගැනීමට පමණක් නොව රජු යනු ''සාසනය වෙනුවෙන්'' රට පාලනය කරන්නාය යන බවට ඇති පැහැදිලි අර්ථකථනයත් ඒ ගැන ඇති මනා අවබෝධයත් නිසාය. සිංහලේ රජ පරපුරේ අවසන් සියවස් දෙක තුන වන විට පරසතුරු ආක්‍රමණ, රජ පවුල් අතර ගැටුම් ආදිය නිසා රටේ තනි පාලනයක් නොවූ අතර පසුව රදළයන් අතර තිබූ ආරවුල්, රජු සහ රදළයන් අතර තිබූ අසමගියද හේතුවෙන් සිංහලේ රජු ද සිංහලේ රට ද බ්‍රිතාන්‍යයන්ට පහසුවෙන් අල්ලා ගන්නට හැකි විය.

එසේ වුවද සිංහල නායකයින් උඩරට ගිවිසුමේදී "බුද්ධ සාසනය හා දේවාගම ආරක්ෂා කොට සංවර්ධනය කිරීමට සහ සිංහල සිරිතට අනුව රට කරවීමට" අදාල වගන්ති ඇතුලත් කළේ රජු නැතිවිට මහජනතාව වෙනුවෙන් සහ සිංහලේ පාලකයන් වෙනුවෙන් කළ නියෝජනයේදී මෙම ඉල්ලීම "සාසනය'' වෙනුවෙන් ඔවුනට කළ යුතුව තිබූ බැවිනි. 'සිංහලේ අපට අහිමි වුවද සුද්දා යටතේ හෝ බුද්ධ සාසනයට හිමි තැන රැකීමට ඔවුන් කැපවූ ආකාරය ඉතා ප්‍රශංසනීයය.

**සුද්දා යටතේ සිංහලේ පරිහානිය**




ගිවිසුම් සහිතව, සාමකාමීව රට භාරගත්තද සිංහලේ සූරා කෑමට පැමිණි සුද්දාගෙන් ඉහත ඉල්ලීම් ඒ ලෙසටම ඉටුනොවීය. සිංහලේ බෞද්ධ චින්තනයට, ජාතික සමගියට සුද්දා නිරතුරු බාධා පැමිණෙවීය.

සිංහලේ භික්ෂුවගෙන් ජනතාවට ලැබෙන නායකත්වය, අනුශාසනා හා චිත්ත ධෛර්යය පිළිබඳ දැනගත් සුද්දා සිංහලයා මානසිකව ද, ශාරීරිකව ද, ආර්ථිකමයව ද දුර්වල කිරීමට සැළසුම් කළේය. භික්ෂුව හා ජනතාව දුරස් කිරීමටත් භික්ෂුවට සිංහල සමාජයේ ඇති පිළිගැනීම නැති කිරීමටත් මුලින්ම කළේ පංසලේ භික්ෂුව විසින් ගමක ඇති කල යුක්තිය විසඳීම, සාමය, සමාදානය පිළිබඳ වගකීම උගත් කමින් සහ ගුණවත් කමින් පහත් වූ රජයේ පඩි කන පොලිස් කාරයාට පැවරීමය. ඒ අදින් හරියටම 150 වසරකට පෙරය. බයිබලයේ ආගම් වලට සුද්දා මුල් තැන දුන්නේය. සිංහලයා නිදහස උදෙසාත්, සුද්දන්ගේ අසාධාරණකම් සහ

නොපනත් කම් වලට විරුද්ධවත් කළ කැරලි වලදී ඊට පළිගැනීම් වශයෙන් වෙල්ලස්ස ආදී ජාතියට බත සැපයූ සරුසාර වතුපිටි කුඹුරු විනාශ කරණ ලද අතර එඩිතර, ශක්තිමත් සිංහලයන් ලක්ෂ ගණනින් ජීවිතක්ෂයට පත් කරණ ලදී.

එතනින් නොනැවතුණු ඔවුහු කැවත් නොකැවත් වෙනසක් නැති සුදු පාන් පිටි වැනි අපට නුහුරු නිසරු ආහාර රටාවක් ද හුරු කළා පමණක් නොව මත් පැන්, දුම් වැටි වලටද හුරු කොට ශාරීරිකව, මානසිකව මෙන්ම ආර්ථිකවද සිංහල ජාතිය පරිහානියට පත් කළහ. දුර්වල සිංහලයෝ ආදීනව දන දැනත් අදටත් මේ දුරාචාර ඉහලින් අගයකරති.

සුද්දාගේ බෙදා පාලනය කිරීමේ න්‍යාය යටතේ මෙරට සුලු ජනවාර්ගිකයන්ට සිංහලයාට වඩා ඉහල තැනක් සහ අධ්‍යාපනයක් ලබා දී නිදහස වෙනුවෙන් සටන් කළ සිංහලයා තව දුරටත් භේද භින්න කළහ. මේ සඳහා ආගම් බේද, කුල බේද, පංති බේද සහ උඩරට පහතරට භේදය ද යොදා ගත්තා පමණක් නොව අන්තිමේදී මේ රට දමා යන විට සිංහල අපට අදට ඇති භයානකම භේදය වන පක්ෂ භේදය ද ගෙනාවෝය. අදටත් සිංහලයාගේ කිසිම එකමුතු කමක් නැත්තේ සුද්දා හසුකර තිබෙන මේ උගුල් බේද තේරුම් ගැනීමට නොහැකී වීම නිසාය. ඒ මදිවාට සිංහලයාට අනුශාසනා කළ යුතු භික්ෂු සංඝයාද නිකාය භේද පමණක් නොව දේශපාලන පක්ෂ භේදයකින්ද යුතුව සිටීම ඉතා කණගාටු දායකය.

**"අයිතිවාසිකම, වගකීම සහ අභිමානය" අමතකවූ සිංහලයාට නිදහස ලැබීම**

නොයෙකුත් ඉල්ලීම් හා හේතු මත අපට සුද්දාගෙන් නිදහස ලැබුණි. ඔවුන්ගෙන් අපට ආපසු ලැබුනේ ගිවිසුමක් යටතේ අපෙන් භාරගත් **'සිංහලේ'** නම් වූ රට වෙනුවට **Ceylon** (ලංකාව) යන නම සහිත වූ රටක් අප වෙත පැවරූ ව්‍යවස්ථාවක්ද සමගය. මෙහිදී සිංහල රජුගෙන් උදුරා පවරාගත් රටවන **'සිංහලේ'** එහි උරුමක්කාර වැසියන් වන සිංහල මහ ජාතියට ආපසු භාරදීමක් වශයෙන් සිදුවූවා නම් සාධාරණ පැවරීමක් යයි කිව යුතුය. මේ කාලය වන විට සිංහල අප නියෝජණය කළ සිංහල දේශපාලකයන්ට තම රට වන 'සිංහලේ' පිළිබඳව අප සතු **"අයිතිවාසිකම, වගකීම සහ අභිමානය"** පිළිබඳව හරි වැටහීමක් නොවූ බව සිදුවූ මෙම අසාධාරණ වලට ඔවුන් එරෙහි නොවීමෙන්ම පෙනී යයි. දෙමළ දේශපාලකයන් 50% ට 50% ආදී අසාධාරණ ඉල්ලීම් ඉදිරිපත් කරන්නේද මේ පසුබිම යටතේය. ඒ වෙලාවේ දෙමළ දේශපාලකයින් සුද්දා යටතේ ලබා සිටි බලවත්කමේ හැටියට රටට **"සිංහලේ"** නම ඉල්ලීම ඔවුන් උරණ කිරීමට හේතුවේයයි සිංහල දේශපාලකයන් පසුබටවූවා යයිද කියනු ලැබේ. කෙසේ වුවද සුද්දාගේ ව්‍යවස්ථාවටද "සම්බුදු සසුනට ප්‍රමුඛස්ථානය දීම සහ ආරක්ෂා කිරීම" සඳහා වගන්ති ඇතුලත් වීම නිසා යම් පමණකින් සිංහල අපට සතුටුවිය හැක.

**ජනරජ ව්‍යවස්ථාවල සම්බුදු සසුන පිළිබඳ වගන්ති සහ අපට තවමත් කරගන්නට බැරිවූ වෙනස්කම්**

සම්බුදු සසුන සුරැකීමට ශ්‍රී ලංකා රාජ්‍යයේ පරම බැඳීම 1972 සහ 1978 ජනරජ ව්‍යවස්ථාවල "ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේය" යනුවෙන් පැහැදිලි නිර්වචනයක් නොමැති "වාක්‍යයක්" වශයෙන් පමණක් පවතී. 1972 සහ 1978 දී ජනරජ ව්‍යවස්ථාවලට අරමුණුවුයේ පාලක දේශපාලන පක්ෂවල පාලනය වඩා පහසු කරගැන්මය. නමුත් නිදහස ලැබෙන විට සිංහල අපට සිදුවූ බරපතල අඩුපාඩුත් ඒ සමගම හඳාගන්නට බැරිවීමෙන් පෙන්නුම්කරන්නේ ජාතියට වඩා පක්ෂය දිනවීම දක්වා අප ජාතික අභිමානයේ ශෝචනීය පිරිහීමයි. **'සිංහලේ'** පිලිබඳව අප සතු **"අයිතිවාසිකම, වගකීම සහ අභිමානය"** සඳහා අපේම ව්‍යවස්ථාවෙහි නිසිතැන ලබාගැනීමට අපට අදටත් බැරිය.

අපට එසේ බැරිවුවත් බොහෝ රටවල් සුද්දා නිදහස දෙනවිට එම රටවල සිටින මහා ජාතියට බලහත්කාරයෙන් පටවාගිය අසාධාරණ ව්‍යවස්ථා, ප්‍රතිපත්ති, කොන්දේසි සහ ක්‍රියාමාර්ග වටහාගෙන ඒවා පසුව වෙනස් කරගෙන තම අභිමානය සාධාරණ ලෙස යලිත් ඉහලින්ම දරා ගන්නා ලදී. උදහරණයක් ලෙස මැලේසියාව එරට සිටින සංක්‍රමණික චීනජාතිකයන්ටද සහ බ්‍රිතාන්‍යයන් එහි ගෙනවිත්දැමූ ඉන්දියන් කාරයන්ටද අභිමි ප්‍රමුඛත්වයක් තම මැලේ ජාතික "භූමි පුත්‍රයන්ට" ලබාගන්නා ලදී. "සිංහලේ" පිලිබඳව ඇති **"අයිතිවාසිකම, වගකීම සහ අභිමානය"** දරමින් අපද මුලින්ම එවැන්නක් කළා නම් වටිනා ජීවිත, දේපල විනාශකරමින් ව්‍යාජ ඊළමක් සඳහාවූ තිස් අවුරුදු නිස්සාර දෙමළ ත්‍රස්තවාදය අපට ඉතා පහසුවෙන් වළක්වා ගන්නට අවශ්‍ය ප්‍රතිපාදන තිබුනි.

එපමණක් නොව ඉස්ලාම් වැනි "**අන්‍ය ආගම් නොඉවසන ආගම්**" පිළිබඳ අපේ නොදැනීම ද ලොවටම පෙන්වන්නේ "සියළුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන්නටද" වගන්ති ව්‍යවස්ථාවට ඇතුලත් කිරීමෙනි. එවැනි ආගමක අයිතිවාසිකම් ආරක්ෂා කරනවා කියන්නේ තම ගෙල සිදීමට සතුරාට කඩුව දීමකි. **බුදුසසුනට පූජාකළ මෙම පින්බිමේ සිංහල අපවිසින් අපේ "අයිතිවාසිකම, වගකීම සහ අභිමානය" දරමින් බුදුසසුන පෝෂණය කළයුතුනම් බුදුසසුනට අනුව පැහැදිලිලෙසම මිත්‍යාදෘෂ්ටින් වන අන්‍ය සියලු ආගම්වල අයිතිවාසිකම් ආරක්ෂාකිරිම අපට බැඳීමක් කුමටද?** ඉස්ලාම් රටවල් යයි කියාගන්නා රටවලින් ප්‍රමුඛ රටවන සවුදි අරාබියාවේ ඉස්ලාමය හැර අන්‍ය කිසිම ආගමකට පිරිනැමෙන අයිතිවාසිකමක් ආරක්ෂා කර දෙන්නට ඔවුන් කටයුතු කරනවාද? අප ඉස්ලාම් ලෝකයෙන් ගතයුත්තේ මෙවැනි නිර්භීත පාඩම් නොවේද? අපට මානව හිමිකම් උගන්වන සමහර බටහිර රටවල සීග්‍රයෙන් වැඩිවන

මුස්ලිම් ජනගහනයෙන් මතුව එම රටවලට එල්ලවන බිහිසුණු, ම්ලේච්ඡ ත්‍රස්තවාදී ප්‍රහාර වලින් තම ජනතාව ආරක්ෂා කරගැනීම සඳහා ඉස්ලාමයත්, කුරනයත් තහනම් කිරීමටත්, එම රටවල සිටින මුස්ලිම් සංක්‍රමණිකයන් ඔවුන්ගේම මවු රටවල් කරා ආපසු යැවීමටත් එම බටහිර රටවල් දැන් කටයුතු කරගෙන යති. අප බටහිර ලෝකයෙන් ගතයුත්තේ මෙවැනි නිර්භීත පාඩම් නොවේද? මෙම පාඩම් ඉතා සරලය. අවශ්‍යම නම් අපටත් කල්නොයවා ක්‍රියාත්මක කළහැක.

අනෙකුත් බොහෝ රටවල මහ ජාතිය මෙන් සිංහලයා තම අභිමානයෙන් යුක්ත වූවා නම් භේද භින්න නොවී නිදහසින් පසු එකමුතු වී තම අයිතිවාසිකම් රැක ගැනීමට අවශ්‍ය පසුබිම සදා ගන්නට අවස්ථාවන් ගෙවීගිය 69 වසරක් තුල ඕනෑතරම් තිබුණි. ඕලන්දක්කාරයන් පැනවූ තේසවලමේ සහ මුක්කුවලමේ යන නීති සිංහලයාගේ අයිතිවාසිකමට බලපාන විකෘතීන්ය. යාල්පානම් වෛපමලය ආදී වූ පසුව ගොඩනැගූ මිත්‍යා ඊලාම් වංශයන් ද තවත් විකෘතීන්වේ. මේවා සම්පූර්ණයෙන්ම නිශ්ප්‍රභ කිරීම මේ රටේ භාරකාරත්වය දරණ සිංහලයා විසින් කලින්ම කළ යුතුව තිබුණි. විදේශිකයින් අපට පැටවූ අසාධාරණ නීතිරීති සහ මිත්‍යාවන් පමණක් නොව Adam's Peak ආදීවූ අපේ පැහැදිලි ඉතිහාසයට එරෙහිවන නාමයන් පවා තවමත් පවත්වාගෙන යන්නේ දීන යටත් විජිත මානසිකත්වය අලජ්ජී ලෙස ලොවට ප්‍රදර්ශනය කරමිනි.

දෙමළ දේශපාලකයෙකු වන සුමන්තිරන් මහතා ළඟදී රූපවාහිනී නාලිකාවකදී කියා සිටියේ ව්‍යවස්ථාවෙන් බුදු දහමට ප්‍රමුඛස්ථානයක් දීමට කොහෙත්ම බැරි බවයි. පසුගිය දා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා පත්කර ඇති මෙහෙයුම් කමිටුවේදී **ද්‍රවිඩ ජාතික සන්ධානය** නියෝජනය කරමින් ඒ මහතා කීවේ **ශ්‍රී ලංකාවේ ජීවත් වන සියලු ජාතීන්ට එක සමානව සළකන බවට වත්මන් ආණ්ඩුව පොරොන්දු වනවා නම් කිසිදු ආගමකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රමුඛතාව ලබාදිය නොහැකි බව**" ය. ඔහු මේ බාල බොළඳ කතා කියන්නේ "**බුදු සසුනට**" පූජාකළ අප සිංහලේ පින් බිමේම සිටගෙනය. ව්‍යාජ ඊලාම් ඉතිහාසයක් පෙන්වමින් දෙමළජනයා උසිගන්වන ද්‍රවිඩ ජාතික සන්ධානයටත්, සුළු ජාතික සහ ආගමික සංක්‍රමණිකයින්ට නීතියෙන්ම රට පවා දීම අරමුණු කරගෙන ජනතාව නොඉල්ලූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකට අතගැසූ වත්මන් ආණ්ඩුවටත් සිංහලයාගේ අභිමානය ගැන සුළු හෝ දැනුමක් ඇත්දැයි සොයා බැලිය යුතුය.

"සිංහලේ" නම්වූ රටේ සිංහලයා සතුවූ ද, කිසිවෙකුටවත් අභියෝග කළනොහැකිවූ ද, ශුද්ධවූ පරම අයිතිවාසිකම පිලිබඳ ඓතිහාසික පසුබිම අද වනවිට සිංහල අපටම අමතකවී තිබීමේ අවාසනාව සුමන්තිරන් මහතාගේ එම බොළඳ ප්‍රශ්නයටවත් නිසි පිළිතුරක් දී ගන්නට බැරිවූකමෙන්ම නොපෙනේද?

**අදටත් සිංහල ජනතාව බහුතරයක් සිටින රට තුල අප දැරිය යුතු අභිමානයෙන් යුතුව ජාතියක් වශයෙන් එක්වී නම් අපට සිංහලේ රටට ඇති "අයිතිවාසිකම, වගකීම සහ අභිමානය" පිලිබඳව ව්‍යවස්ථාවේ පවතින අඩුපාඩුද හදාගෙන රටට "සිංහලේ' යන අර්ථාන්විත නමද ලබා නිදහස්, නිවහල් රටක් වශයෙන් දියුණු වීමට හැකියාව හා අවස්ථාව හොදටම ඇත. අප මෙය කල යුත්තේ අන්‍ය සුළු ජාතික සහ ආගමික සංක්‍රමණිකයින්ට එරෙහිවීමක් වශයෙන් නොව අපට අවශ්‍ය ලෙස අපේ රට ගොඩනගා ගැනීම වෙනුවෙනි. ඔවුන්ගෙන් අප සතු "අයිතිවාසිකම, වගකීම සහ අභිමානය"ට සිදුවියහැකි අනවශ්‍ය බලපෑම් නිෂ්ප්‍රභ කරගෙන මෙම පින්බිමේ ඉපදිනු බෞද්ධ අපේ අභිමතාර්ථයන් නිදහසේ නිස්කලන්කව ඉටුකරගන්නටය.**

**අපේ ගරුතර සංඝරත්නය**

අපේ අභිමානය ගැන මෙසේ අවුරුදු 180 ටත් වඩා ගතවී අප කතාකරද්දී සිංහල බෞද්ධයාගේ අභිමානය ඉතා නිහඬව නිහතමානීව එදා මෙන්ම අදත් වගකීමෙන් දරාගෙන තම යුතුකම, වගකීම ඉටු කරමින් ඒ සඳහා සිංහල බෞද්ධයා පොළඹවන ඉතා ශ්‍රේෂ්ඨ පිරිසක් මෙම සිංහලේ වැඩ වාසය කරති. අවසර, ඒ අපේ ගරුතර සංඝරත්නයයි.

නම වතාවක්ම බුදු සසුනට පූජා කළ සිංහල ද්වීපයේ අයිතිය ගරුතර සංඝරත්නය දැරිය යුතු වුවද එදා පිට පිට නව වතාවක්ම නැවත නැවතත් සිංහලේ රජු වෙත රක පාලනය කිරීමට භාර කළ උන්වහන්සේලා කිසි විටකත් තම යුතුකම හා වගකීම ඉටුකරනු මිස අයිතිවාසිකමක් ගැන කථා නොකළහ. ඒ පිළිබඳ අදටත් කථා නොකරති. තම ජාතිය සතු අභිමානයක් ගැන නොදන්නා ජනතාවකට මෙම අයිතිවාසිකම ගැන කෙලින් කථා කළා නම් අප ර්නියා සිංහල බෞද්ධ පිරිස උන්වහන්සේලා උන්මත්තකයින් පිරිසක් යයි හංවඩු ගසනු නොඅනුමානය. කෙසේ වුවද සම්බුදු සසුන වෙනුවෙන් මෙම අයිතිවාසිකම අදටත් දරණුයේ උන්වහන්සේලාමය. එය ඉතා පැහැදිලිය.

බුදු සසුනට පිදූ මේ පින් බිම විදේශ ආක්‍රමණයන්ට ගොදුරු වූ හැම විටකමත්, රට අරාජික වූ හැම විටකමත් සුදුස්සන් ඉදිරිපත් කොට, උනන්දු කොට නැවත මුදාගෙන රට භාරදී ආරක්ෂා කිරීමට පෙරමුණ ගත්තේද නිරතුරු අනුශාසනා කළේද අප ගරුතර සංඝරත්නයයි. උන්වහන්සේගේ මේ කැප කිරීම ඉතිහාසය තුලින්ද වර්තමාන භික්ෂුවගේ ක්‍රියාකාරිත්වය තුලින්ද විදහා දක්වා ඇත්තාහ. උන්වහන්සේලා අප ජාතියේ මුර දේවතාවන් වහන්සේලා වන්නේ එහෙයිනි.

ජාතික සංඝ සම්මේලනය සංවිධානයකර 2003 මාර්තු 22 දින විහාරමහා දේවී උද්‍යානයේ පැවැත්වූ මහා සංඝ සමුලුවේ දී එහි සභාපති ධුරන්දර පුරාවිද්‍යා චක්‍රවර්ති පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමියන් පැවසුවේ "**නම වාරයක් බුදු රජුන්ට පූජා කළ රට ආරක්ෂා කිරීම සඳහා සංඝරත්නය පෙරමුණ ගත යුතුය යන්නය.**" මෙහිදී ජාතික සංඝ සම්මේලනය ඉදිරිපත්කල බෞද්ධ රාජ්‍යයක් උදෙසා වන සංඝ ආඥාවද එහි අඩංගු යෝජනා හතද ඉදිරියේදී එලි දක්වන නව ව්‍යවස්ථාවට ඇතුලු කිරීමට අප ජාතික සංඝ සම්මේලනය කටයුතු කරණු ඇතැයි සිතමු. එසේම 2016 ජුනි 23 දා '**යුතුකම සංවාද කවය**' විසින් කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ පැවති '**පෙඩරල් සංහිඳියාව**' නම්වූ සම්මන්ත්‍රණයේදී පූජ්‍ය ඇල්ලේ ගුණවංශ හිමියන් වැදගත් ප්‍රකාශයක් කළෝය. එනම්, "**රටේ අයිතිකාරයන් වශයෙන් සිටිය යුතු හාමුදුරුවරු අද බෝඩින්කාරයෝ වෙලා**" යනුවෙනි. එහිදීත් උන්වහන්සේ තමන් රටේ අයිතිකාරයින් වන්නේ කෙසේද යන්න ප්‍රකාශ නොකිරීමට ඉතා නිහතමානීව ප්‍රවේසම් වූහ. නමුත් අප බුද්ධිමත් නම් සිංහල බෞද්ධයන් වශයෙන් උන්වහන්සේගේ ප්‍රකාශය තේරුම් ගැනීමට පොහොසත් විය යුතුය. එය එසේ වූවා ද? පසුගිය සැප්තැම්බර් මස මහනුවරදී පැවති අනගාරික ධර්මපාල තුමාගේ ගුණසමරුවකදී අග්ග මහා පණ්ඩිත පූජ්‍ය අලුත්ගම ධම්මානන්ද හිමියන් පැවසුවේ "**සිංහල ජාතිය අවදි නොවුනහොත් විසඳිය නොහැකි බරපතල අර්බුදයක් ඉදිරියේදී මතුවිය හැකි බවය**".




මෙසේ වරින් වර සිංහලයා සතු වගකීම, යුතුකම සහ අයිතිවාසිකම සිහිකර දෙන ගරුතර සංඝරත්නය, **බොදුබල සේනාව, සිහල රාවය, රාවණා බලය, යුතුකම සංවාද කවය, සිංහලේ ජාතික සංවිධානය** ආදී වූ මෙහි නම් සඳහන් කළ සහ නොකළ විවිධ සංවිධාන හරහා පෙරමුණ ගනිමින්, ලිපි ලේඛන, මාධ්‍ය රූස්වීම්, සාකච්චා, සම්මන්ත්‍රණ ජනරැලි, විරෝධතා ව්‍යාපාර පමණක් නොව අන්තර්ජාල හා සමාජ වෙබ් අඩවි වැනි විද්‍යුත් මාධ්‍ය ඔස්සේ  තම කැප කිරීම මනාව ඉටුකරණ විටදී එය තේරුම්ගෙන අගය කරනු, අනුමත කරනු මිස උන්වහන්සේලා පිටුපස සිටින්නේ කවුදැයි පටු දේශපාලන දෘෂ්ටියෙන් විපරම් කිරීම අභිමානවත් සිංහලයෙකුට කිසිසේත්ම නොවටී. අද ජාතිය පත්ව සිටින බරපතල තත්ත්වය හෝ ජාතියේ අභිමානය ගැන හෝ නොදන්නාවුත් නැතහොත් නොසලකන්නාවුත් අප සමහර බෞද්ධයන් අපට

විනකරන සුලුජනවාර්ගික පිරිස්වල පැත්තම ගනිමින් ගරු ස්වාමීන්වහන්සේලාගේ වාග් විලාශයත්, තරුණ ආවේගශිලිබවත්, සමහරවිට ශිලයත් අනවශ්‍ය ලෙස විවේචනය කරමින් උන්වහන්සේලාගේ කැපවීම අවතක්සේරු කිරීමටත්, එමගින් තම වගකීමෙන් මගහැරීමටත් යොදාගැනීම කනගාටුවට කරුණකි. ‘‘තමා අකමැති පණිවිඩය ගෙන ආ පමණින් පණිවිඩකරුවා මැරිය නොයුතුය’’ යයි කියමනක් ඇත (Do not kill the messenger). අප විසින් සොයාබැලිය යුත්තේ උන්වහන්සේලා පෙරටු කරගෙන සිටින උතුම් අභිමතාර්ථයන් දෙසය. එසේම උන්වහන්සේලාගේ අනුශාසනා ඔස්සේ ක්‍රියාත්මක වියයුත්තේ සසුන රැකීමේ වගකීම දරණ සිංහල බෞද්ධ ජනතාව වන ගිහි අපය.

## සිංහල බෞද්ධ ජනතාව අද කොතැනද?

අපේ සංසරත්නය උන්වහන්සේලාගේ යුතුකම නිහතමානීව මෙසේ ඉටු කරද්දී රට වැසි සිංහල බෞද්ධ ජනතාව අද කොතැනද? ජාතික අභිමානයකින් තොරව පක්ෂ වලට බෙදී තම ජාතිය නොව ඒ වෙනුවට තම ජාතිය බෙදන්නා වූ පක්ෂයක් බලයට පත් කරගෙන එසේ පත් කිරීමට උපකාර කළ සුලු ජනවාර්ගික පක්ෂ වලට වූ පොරොන්දු හා වරදාන නිමක් නැතිව දෙන එපමණක් නොව අභිමානවත් නිවහල් ජාතියක් විසින් ඉඳුරා ප්‍රතික්ෂේප කළ යුතු විදේශ මැදිහත් වීම් වලටද හිස නමමින් තමා තවමත් දරා සිටින යටත් විජිත මානසිකත්වය නිසාදෝ නොරැටියන්ට වූ ලැජ්ජා සහගත පොරොන්දු ඉටු කරණ බියගුලු තැනය. මේ සියල්ල දේශපාලකයන් අකුරට ඉටු කරන්නේ තමා බලයට ඒමට ඡන්ද බලය යෙදූ මෙරට භාරකාරිත්වය දරණ සිංහල ජාතිය අමතක කරමින්ය. මේ ප්‍රවනතාවය අති භයානකය. අභිමානයක් නැති අපේ නුතන පක්ෂ දේශපාලකයාගේ ව්‍යායාමය දුටුගැමුණු රජතුමා පිලිකුල් කළ අලජ්ජී ක්‍රියාව එනම් **‘‘රටත්, ජාතියත්, බුද්ධ සාසනයත් පාවාදී හෝ හැකි ඉහලින්, දිගු කාලයක් රජසැප විඳීම’’** සඳහාය.

කුමන පක්ෂයක වුවද පාලකයන් මේ ක්‍රියාවලිය යොදා ගන්නේ නැවත බලයට ඒමටත් එමගින් තමාගේත්, පාක්ෂිකයන්ගේත් බඩගොස්තරය සරිකර ගන්නට මිස රටක් රැකීමට, දියුණු කිරීමට නොවේ. පක්ෂ වලට බෙදුනු සිංහල පාක්ෂික චන්දදායකයෝද දේශපාලකයන් බලයට පත්කරන්නේ පක්ෂයේ ලොක්කාගේ මාර්ගයෙන් තමාගේද බඩගෝස්තරය සරිකර ගන්නටය. සතුටින් අසූචි ගිලින ඌරන්ගේ තත්ත්වයට පත් සමහරු **‘‘අපේ හොරා අපට හොඳා’’** යයි කියමින් දූෂිත නායකයින් අභිවන්දනය ද කරති.

ජන්දය දිනීම යනු රිසිසේ ධනය, සම්පත කොල්ලා කන්නට ලැබුණු අවසර පත්‍රයක්, ලයිසමක් ලෙස අද සැලකේ. අභිමානයක් නැති සිංහල ජනතාවද කොළ, නිල්, රතු වර්ණ වලට බෙදී තට්ටු මාරු ක්‍රමයට රට කොල්ලා කෑමට

දේශපාලකයන්ට ශුද්ධ වූ අයිතියක් ඇත, කලින් ආණ්ඩුව කළ සියලු වැරදි කිරීමට ඊළඟට එන ආණ්ඩුවට ද ශුද්ධ වූ අයිතියක් ඇත යන සම්මුතියකට පැමිණ සිටිති. මේ අප නිදහස ලබුනදා පටන් දුටු යථාර්තයයි. මෙය තවත් ඉදිරියට ගෙනයා යුතුද?

මේ ගතවන්නේ කොළ, නිල් එකතුව “යහපාලනය” නමින් රජකරන, එනමුත් මෙම එකතුවට කලින් තිබූ ආණ්ඩු කළ සියලු වැරදි එක්වී කරමින් සිංහල බෞද්ධයාටම කෙනෙහිලිකම් කරන අපූරු යුගයකි.




දැනට තිබෙන පක්ෂ දේශපාලනය අප රටට කිසිසේත් නොගැලපෙන බවට තවත් අත්හදා බැලීම් අනවශ්‍යය. පක්ෂ සංකල්පයට අප රටට ගැලපෙන්නාවූ අරුත ලඟදි ලබාදුන්නේ පූජ්‍ය ඇල්ලේ ගුණවංශ හිමියන්ය. ඒ පසුගිය දෙසැම්බර් 19 දා **‘යුතුකම සංවාද කවය’** විසින් කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ පැවැත්වූ **“පෙඩරල් සංහිඳියා නිරුවත”** නම්වූ මහජන සම්මන්ත්‍රණයේදීය. මේ රටේ සිටින්නේ “**පූජ්‍ය සහ ගිහි**” වශයෙන් පක්ෂ දෙකක් බවත් මේ දෙපක්ෂය එකතු වී රට බේරාගත යුතු බවත් උන්වහන්සේ අවධාරණය කළහ. මහා විනාශයකට පෙර සම්බුද්ධ සාසනය රැකීම වෙනුවෙන් අපේ **පූජ්‍ය සහ ගිහි** යන පක්ෂ දෙකට තම නිල්, කොළ, රතු බේද ඉවතදා එකතු වීමට ලැබෙන පළමු සහ අවසාන අවස්ථාව මෙය වියහැක.

**සම්බුද්ධ සාසනය රැකීමට ඇති සිංහල අපේ වගකීම ඉටුනොවුවහොත් ප්‍රතිඵලය භයානකය**

සිංහලේ අභිමානය දරාගෙන “සම්බුද්ධ සාසනය රැකීමට” ඇති අපේ වගකීම මේ ගතවන අන්තිම මොහොතේ හෝ ඉටුනොවුවහොත් ප්‍රතිඵලය භයානකය. එවිට වන්නේ පෙර අපේ රජ දරුවන් විසින් සම්බුදු සසුනට පුජාකරන ලද්දාවූ ද අති උතුම් පූජනීය වස්තූන් දරණ සහ අති පූජනීය ස්ථාන පිහිටි මේ පුණ්‍ය භූමිය පාවාදී අනාථ කර ලෝකයට ණය කිරීමේ පාප කර්මයට සමස්ථ සිංහල ජාතියම දායක

වීමය. මෙය බරපතල පාප කර්මයකි. පාලක දේශපාලකයන් ද ඔවුන් පත්කරගන්නට තම ඡන්ද බලය ලබා දුන්නාවූ ඡන්ද දායකයා ද **"ධර්ම ද්වීපය"** නම්වූ උත්තම පුණ්‍ය භූමියක ඉපිද කරන්නට හැකි ඉහලම පාප කර්මය තමා කරගත්තා වනු ඇත. මෙම කරුණ දේශපාලකයන් මෙන්ම ඡන්ද දායකයා ද තේරුම් ගැනීම මෙහිදී ඉතා වැදගත්ය. එවිට තම වරද වහා නිවැරදි කර ගැණීමට හැකිය. නැතහොත් මෙම ධර්ම ද්වීපයට තමා කළ අපරාධය මැරෙන මොහොතේ හෝ සිහිවී විපාක වශයෙන් ගෝරතර අපා දුක් ලබා දෙනු ඇත.

සිංහලයාගේ වගකීම නොසලකා හරිමින් බලය සහ මුසාව යොදාගෙන රටේ ධනය සහ සම්පත් කොල්ලකමින් අධාර්මික ලෙස රට පාලනය කළ පාලකයින්, ඊට අනුබලදුන් නිලධාරීන් සහ ඉන් ආර්ථික ප්‍රතිලාභ ලද ව්‍යාපාරිකයන් ඇතුළු සියළු දෙනා තමා මෙතෙක් සතුටින් යෙදුන පාපක්‍රියා දෙස හැරී බැලීමට කාලයයි. ඔබසැම මේ පින්බිමේ උපන්නේ උසස් පිනක විපාක වශයෙනි. මෙහි සිට සුගතිගාමීවීම මිස අපාගාමී නොවන්න.

**මේ මොහොතේ අප ගරුතර සංඝරත්නය ඉටුකළයුතු ජාතික මෙහෙවර**

ඉහත සඳහන් කරුණු අනුව ඔබවහන්සේලා ද ඔබ වහන්සේලා විසින් බුද්ධ සාසනය වෙනුවෙන් දරන "සිංහලේ" අයිතිය පැහැදිළි කර ගැනීම ද, සංඝරත්නය වෙනුවෙන් රටේ භාරකාරිත්වය දරමින් රට රැක පාලනය කිරීමේ වගකීම සිංහල ජාතිය සතු බව ජනතාවට පැහැදිළිකර දීම ද, සිංහල ජාතිය වෙනුවෙන් භාරගෙන රට රැක පාලනය කරන පාලකයින් ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් එය හරි හැටි කරගෙන යන්නේදැයි පරීක්ෂාකාරීව සිට ඊට අවශ්‍ය අවවාද අනුශාසනා කිරීම ද අද ඔබ වහන්සේලාගෙන් අප සිංහල ජාතිය බලාපොරොත්තු වන ජාතික මෙහෙවරයි. ඒ සඳහා ඔබවහන්සේලාට සියලු ධෛර්යයත්, තෙරුවනේ ආශිර්වාදයත් ලැබේවා. මෙම ඉල්ලීමේ යම් ප්‍රමාද දෝෂයක් වෙතොත් කමාවන සේක්වා.

**සිංහල ජාතියේ ඉදිරි දැක්ම (Vision) සහ ජාතියේ මෙහෙවර (Mission)**

ඉහත සඳහන් කරුණු නවීන කළමනාකරණ සංකල්ප අනුව කැටිකොට අපට මෙසේද දැක්වියහැක. ව්‍යාපාර සහ ආයතන කළමනාකාරිත්වයේදී මෙන්ම රටක් ජාතියක් වෙනුවෙන් ක්‍රමෝපායන් සම්පාදනයේදී මුලින්ම අවශ්‍යවන එම **ජාතියේ ඉදිරි දැක්ම** (Vision) සහ **ජාතියේ මෙහෙවර** (Mission) ලොව අන් සැම ජාතියකටම පෙර ලැබුනේ අපටය. ඒ සම්බුදු සසුනට නම වාරයක්ම මෙම පින්බර දිවයින පිදූ සිංහලේ රජ දරුවන්ට සහ සිංහලේ ජනතාවටය. දුටුගැමුණු රජතුමාගේ උතුම් ප්‍රකාශය වන **"මාගේ මේ ව්‍යායාමය හුදෙක් රජසැප පිණිස නොව රටත්, ජාතියත්, බුද්ධ සාසනයත් බේරාගැනීම සඳහාය"** යන්න මුළුමහත් ජාතියම ගතයුතු මඟ පැහැදිළිව පෙන්වා දී ඇත. මේ ඔස්සේ අපේ දීර්ඝ ඉතිහාසය පරීක්ෂාකිරීමේදී

පැහැදිලිවන ලෙස අප සිංහල ජාතියේ ඉදිරි දැක්ම වී ඇත්තේ "**සම්බුද්ධ සසුන චිරාත්කාලයක් සිංහල ද්වීපයේ ආරක්ෂා කිරීම**" ය. ජාතියේ මෙහෙවර වී ඇත්තේ "**සම්බුද්ධ සසුන වෙනුවෙන් සිංහල ද්වීපය ආරක්ෂා කරගෙන මනාව පාලනය කිරීම**" යි. ජාතියක් වශයෙන් අප ගතයුතු උපාය ක්‍රියා මාර්ග වී ඇත්තේ "**ජාතියේ ඉදිරි දැක්ම වෙනුවෙන් ඉටුකරන මෙහෙවර සාර්ථක කර ගැනීමට ඒ ඒ කාලයට, අවස්ථාවට උචිතවූ ක්‍රියා මාර්ගයන්ය.**" සිංහල අපට මෙම කරුණු අදටද වලංගුය.

ඒ ඉදිරි දැක්ම, මෙහෙවර සහ උපාය ක්‍රියා මාර්ග වලට අනුකූලව බුද්ධිමත්ව, අප්‍රතිහතව ක්‍රියා කළ සිංහලයාගේ අතීත ශ්‍රී සෞභාග්‍යය ඉතිහාසය අපට ලබාදෙන අභිමානයයි. අපේ අභිමානයන් එඩිතරව දරාගෙන වර්තමානයේ අපගත යුත්තේද ඉතිහාසයෙන් අපට කියාදෙන මෙම නිවැරදි, ධාර්මික මඟමය.

**තම අයිතිය, වගකීම වෙනුවෙන් අද අභිමානයෙන් නැගී සිටිය යුත්තේ සිංහල බෞද්ධයාය.**

පසුගිය සැප්තැම්බර් මස මහනුවරදී පැවති අනගාරික ධර්මපාල තුමාගේ ගුණසමරුවකදී අග්ග මහා පණ්ඩිත පූජ්‍ය අලුත්ගම ධම්මානන්ද හිමියන් පැවසුවේ "**සිංහල ජාතිය අවදි නොවුනහොත් විසඳිය නොහැකි බරපතල අර්බුදයක් ඉදිරියේදී මතුවිය හැකි බවය**". බුද්ධිමත් සිංහල ජාතිය එම අර්බුදය වටහා ගෙන වහා අවදිව ක්‍රියාත්මකවිය යුතුවේ.

අද අප ජාතියක් වශයෙන් මුහුණපා සිටින ප්‍රශ්න රාශියකට සාර්ථක පිළිතුරු සෙවීමේදී කළයුතු මුලික කටයුත්ත නම් සිංහලයාට හිමි අයිතිය, වගකීම සහ අභිමානය සහ එහි ඓතිහාසික පසුබිම තේරුම් කර දී නැවත එම අභිමානය ලබාදීම බව පෙන්වාදිය හැක.

- එසේම සම්බුද්ධ ශාසනය රැකීමට ද ඒ වෙනුවෙන් මේ දිවයිනෙහි භාරකාරත්වය දරමින් එය රැක පාලනය කිරීමේ ශුද්ධ වූ අයිතිවාසිකම, වගකීම සහ යුතුකම අවුරුදු 2,200 කටත් පෙර සිට දරන්නේ සිංහල බෞද්ධයා බව අපගේ සියලුම රට වාසීන්ටත්, සිංහලේ ගැන උනන්දුවන විදෙශිකයින්ටත් අවධාරණය කිරීමට ද නොපමාව කළයුතු ඊළඟ කටයුත්තයි.

- සිංහලයාගේ ඉවසීම නිවටකමක් ලෙස සලකමින් නැති ප්‍රශ්නවලට පිළිතුරු ඉල්ලන ජාතිවාදී සහ ආගම්වාදී සුලු ජනවාර්ගික පිරිස් වලට ද දිය යුතු එකම පිළිතුර ද සිංහලයාට හිමි අයිතිවාසිකම, වගකීම සහ අභිමානය ගැන මනාව තේරුම් කර දීමමය. ව්‍යාජ ඊලාම් නිජබිම් සංකල්පයට පිළිතුර ද එයයි.

- අභිමානවත් සිංහලයා බුද්ධිමත්ව, වගකීමෙන් යුක්තව ක්‍රියා කළ යුත්තේය. දැනට මේ රටේ පවතින ප්‍රජාතන්ත්‍රවාදය අනුව යමින් සිංහලයා තමන් සතු රට රැකීමේ, පාලනය කිරීමේ අයිතිය හා වගකීම සුදුසු පාලකයෙකුටම පැවරිය යුත්තේ සිංහල අප සැමගේම ඡන්ද බලය යොදාගනිමින් රජයක් තෝරා ගැනීමෙනි. එසේ තෝරා ගන්නා රජයේ ප්‍රධානියා මෙන්ම අනෙකුත් නායකයින්ද ජාතියේ අභිමානය දරමින් රට රැකීමටත්, පාලනය කිරීමටත් සමත් උගත්, බුද්ධිමත්, චරිතවත්, අභීත, අවංක සත්පුරුෂ බෞද්ධ නායකයින්ම විය යුතුය. මෙම තෝරාගැනීම කල හැක්කේ සිංහලයා ජාතියක් වශයෙන් එකට එක්වී මිස දැනට පවතින සිංහලයා භේදකරන පක්ෂ දේශපාලනයකින් තොරවය. උතුම් බුදුදහමින් ඔපවැටුණු වසර 2,200කට වැඩි දීර්ඝ දියුණු සත්‍යවාදී බෞද්ධ ශිෂ්ටාචාරයක් හිමි සිංහලේට පිටරටවලින් ආනයනිත ධනවාදය, සමාජවාදය, කොමියුනිස්ට්වාදය, ලිබරල්වාදය ආදී වශයෙන්වූ නොගැලපෙන වාද හරහා සිංහලයා බෙදා දුර්වල කළ පක්ෂ භේදය වහා තුරන් කිරීමට කාලය එළඹ ඇත.

- සිංහලේ පිළිබඳව සිංහලයාට හිමි අයිතියට වගකීමට සහ අභිමානයට අනුකූලවූ රට දැය සමය මූලික කරගත් අපේම ව්‍යවස්ථාවක් සහිතව අපටම අනන්‍ය වූ දේශපාලනික සැකැස්මක් දැන්වත් සිංහල අප විසින්ම ඇතිකරගත යුතුය.

- මෙම වැඩපිළිවෙල හරිහැටි ඉටුවුවහොත් මෙම සිංහල ද්වීපය නිදහස්, නිවහල් සහ සාමකාමී රටක් බවට පත්කරගෙන සිංහලයාට හිමි අයිතිවාසිකම සහ වගකීම මානව ඉටුකරගෙන නිවී සැනසිල්ලේ බුදු දහමේ දැක්වෙන විමුක්ති මාර්ගය සාදාගන්නටත් අනෙකුත් ලෝක වාසීන්ට එම මාර්ගය පහදා දෙන්නටත් අපට මෙන්ම අපේ දරුමුනුපුරන්ටත් හැකිවනු ඇත. **"ධර්ම ද්වීපය"** නම්වූ උත්තම පුණ්‍ය භූමියක මිනිසෙකුව ඉපදීමේ වාසනාවෙන් ගතහැකි උතුම් ඵලය එයයි. ඒ සදහා සිංහලයාට උපරිම නිදහස මේ පින්බිමේ තිබිය යුතුය. සම්බුදුසසුන වසර 5,000 කල් රැකගැණීම ප්‍රයෝගික වන්නේ අපවිසින් එය ජීවමානව එසේ පවත්වාගෙන යාමෙන් පමණි.

- සම්බුදුසසුන රැකගැණීමට අවශ්‍ය පරිසරය සකස්කර ගැණීම ඇත්තෙන්ම අපට කිසිසේත් කළ නොහැක්කක් නොවේ. බුද්ධශාසනය අවුරුදු පන්දහසක් කල් පවත්නේ නිමක් නැති උතුම් පූජා වස්තූන් දරන පුණ්‍ය භූමියක්වූ මෙම සිංහල ද්වීපයේ බවට බුදුරජානන්වහන්සේ ශක්‍ර දෙවියන්ට කළ ප්‍රකාශයත්, තුන්වරක් වූ උන්වහන්සේගේ මෙහි වැඩමවීමත් අනුව පෙනෙන්නේ කොපමණ බාධක ආවත් සිංහල බෞද්ධ අපට මෙය ඒකාන්තයෙන්ම කළ හැක්කක් බවයි. නමුත් එය ප්‍රාතිහාර්යකින් ඉටුවන්නේ නැත. ඒ සදහා අපේ කැපවීමෙන් යුතු ක්‍රියාත්මක වීමයි වහ වහා අවශ්‍යව ඇත්තේ. අද අප ඉටු කළයුතු උතුම් ජාතික

මෙහෙවර එයයි. අප සැවොම එකාමෙන් එක්වුවහොත් මෙය ඉතා පහසු මෙහෙවරක් වන්නේය.

- මේ සියල්ල සඳහා අපට ඇති වටිනා කාළය ඉක්මනින්ම ගෙවී යන බව මතක් කරමු. අද සිංහල ද්වීපයට ඇති තම අයිතිය පමණක් නොව සම්බුදුසසුන රැකගැණිමට ඇති වගකීම වෙනුවෙන් අභිමානයෙන් යුතුව නැගී සිටිය යුත්තේ තවමත් නිදා සිටින සිංහල බෞද්ධයාය.

***මේ සියල්ල සඳහා ඔබ අප සැමට සියලු ධෛර්යයත්, තෙරුවනේ ආශිර්වාදයත් ලැබේවා!***

**සුදර්ශන රම්බන්ඩාර**
2017 පෙබරවාරි 04 දින
(මෙම ලිපියට ඔබේ අදහස් එවන්න - Email: srambandara@ymail.com )






# සිංහලයා විනාශ වෙන ප්‍රධාන ක්‍රම

## බේබදු කම

පිරිමි අති බහුතරයක් බෝතලේට පෙරේත එවුන්.
සුද්දා රට බීම හල් කියලා බාර් විවෘත කරද්දි
ස්වාමීන් වහන්සේලා හඩ නැගුවේ වෙන වින්නැහිය කලින්ම දැනගත් නිසා.
හවස් වරුවේ පියවි සිහියෙන් ඉන්නේ කීයෙන් කීදෙනාද?

## මිත්‍යා විශ්වාස

ගෑනු අති බහුතරයක් ඉක්මනින් රැවටෙන එවුන්.
යන්ත්‍ර,මන්ත්‍ර,ගුරුකම්,කේන්දර,බලි තොවිල්,අනවින කොඩිවින,හූනියම්,
නිමිති,ෆෙන්ෂුයි,වාස්තු,වාලම්පුරි,මැණික් මුදු වලට යටවුන මානසික වහලියන්.
තමන්ට පහසු දවසක වෙලාවක වැඩක් පටන් ගන්න සිංහලයට ලැබෙනවද?

## පක්ෂ දේශපාලනය

තමන්ගේ පරම්පරාවෙන් ජන්දෙ දෙන පක්ෂෙ නිසා,
ඌ අපේ නෑයෙක් නිසා,ඌ අපේ කුළේ නිසා,
කොල්ලට කෙල්ලට රස්සාවක් හදල දුන්න නිසා මැරෙන තුරා උන්ටම ජන්දෙ දීම.
තමන් කැමති එකා කරන ඕනිම පඩත්තර වැඩක් හොඳයි අකමැති එකා කරන
ඕනිම හොඳ වැඩක් නරකයි කියන මානසිකත්වය.

**දැන්වත් රට ජාතිය ආගම ගැන හිතපියවු!**